# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**6 ශ්‍රේණිය**

**ගණිතය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1) වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යය 2ක් නම් කරන්න.




2) අඳුරු කළ කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස ලියන්න.



3) 78 ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

4) 30ත් 50 ත් අතර 6 ගුණාකාර දෙකක් ලියන්න.

5) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.
තිරස් තලයක් වන්නේ ................. (තාප්පය / කොඩි කණුව / ගෙබිම / බිත්තිය)

6) 20554637 යන සංඛ්‍යාව
   i. සම්මත ආකාරයට ලියන්න. ...........................................................
   ii. සංඛ්‍යා නාමය වචනයෙන් ලියන්න. .........................................................

7) පස්වරු දෙකයි මිනිත්තු දොළහයි තත්පර හය අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියා දක්වන්න.

8) නිමල් රු.920 ක් රැගෙන වෙළඳ සැලකට ගොස් රු.738ක භාණ්ඩ මිලට ගනී. ඉතිරිවන මුදල සොයන්න.

9) 36 යනු 6 වන සමචතුරස්‍ර සංඛ්‍යාව වේ. මෙය කී වෙනි ත්‍රිකෝණ සංඛ්‍යාව වේද?

10) පහත හිස්තැන්වලට ගැළපෙන පරිදි “<” හා “>” ලකුණ යොදන්න.

(i) 8 ......... - 1 (ii) -4 ......... -7

11) පහත කෝණ වර්ගයේ නම තිත් ඉර මත ලියන්න.

*a* .....................................................

*b* .....................................................




12) ආරෝහණ පිළිවෙලට ලියන්න.

0.3, 0.035, 0.38, 3.5 .........................................................................

13) චතුර P සිට Q දක්වා නැගෙනහිර දිශාවට ගොස් Q සිට R දක්වා උතුරු දිශාවට ද ගමන් කරයි. ගමන් මග දළ රූපයක දක්වන්න.

14) 108cm, මීටර් හා සෙන්ටිමීටර්වලින් ලියන්න.

15) මෙහි දැක්වෙන්නේ කීවෙනි සමචතුරස්‍ර සංඛ්‍යාවද?



16) එකතු කරන්න.

| | $l$ | $ml$ |
|---|---|---|
| | 5 | 75 |
| + | 3 | 85 |

17)



ඉහත රූප අනුපිළිවෙළින් නම් කර ඇති නිවැරදි පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

i. රොම්බසය, සමචතුරස්‍රය, ත්‍රපීසියම, සමාන්තරාස්‍රය

ii. සමාන්තරාස්‍රය, සමචතුරස්‍රය, රොම්බසය, ඍජුකෝණාස්‍රය

iii. ත්‍රපීසියම, සමචතුරස්‍රය, සමාන්තරාස්‍රය, ඍජුකෝණාස්‍රය

iv. ත්‍රපීසියම, සමාන්තරාස්‍රය, ඍජුකෝණාස්‍රය, රොම්බසය

18) $\frac{8}{12}$ ට තුල්‍ය භාග දෙකක් ලියන්න.

19) ඝනකයක මුහුණතක හැඩය රූපයකින් අඳින්න. එම හැඩය හඳුන්වන නම ලියන්න.

20) 15 හි සාධක දෙකක් 1 හා 15 වෙයි. ඉතිරි සාධක දෙක ලියන්න.

## II කොටස

01) ඔබට පන්ති කාමරයේදී ගණිත ගුරුතුමා/ ගුරුතුමිය විසින් පහත සංඛ්‍යා ඇතුළත් කාඩ්පත් 20ක් ලබා දුන්නේ යැයි සිතන්න.
ඔබ ඉගෙනගත් සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා පිළිබඳ සිහිපත් කරමින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 6 | 8 | 9 | 10 | 12 | 13 | 15 |
| 18 | 19 | 20 | 21 | 25 | 27 | 29 | 30 | 31 | | |

මෙම සංඛ්‍යා අතරින්

i. කුඩාම ප්‍රථමක සංඛ්‍යාව තෝරා ලියන්න.
ii. 25ත් 30ත් අතර ප්‍රථමක සංඛ්‍යාවක් මෙහි ඇත. එය කුමක්ද?
iii. 1ත් 10ත් අතර සමචතුරස්‍ර සංඛ්‍යා කීයක් තිබේද? ඒවා තෝරා ලියන්න.
iv. මෙහි සඳහන් ප්‍රථමක සංඛ්‍යාවක ඉලක්කම් මාරු කළ විට දී ප්‍රථමක සංඛ්‍යාවක් ම ලැබේ. එම සංඛ්‍යා දෙක ලියන්න.
v. 1, 3, 6, 10, ..... මගින් නිරූපණය වන සංඛ්‍යා හඳුන්වන නම කුමක්ද? එම රටාවේ ඊළඟ සංඛ්‍යාව කීයද?
vi. 20ට අඩු සියලු ප්‍රථමක සංඛ්‍යා තෝරා ලියන්න.
vii. මෙහි සඳහන් 5 ගුණාකාර වන සංඛ්‍යා තෝරා ලියන්න.

02)



i. දී ඇති පතරොම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ නම කුමක්ද?
ii. ඒ සඳහා යොදා ගත හැකි වෙනත් පතරොමක් අඳින්න.
iii. ඉහත ඝන වස්තුවේ මුහුණත්, ශීර්ෂ හා දාර ගණන වෙන වෙනම ලියන්න.
iv. ඉහත ආකාර ඝනවස්තු දෙකක් එකට ඇලවූ විට සෑදෙන ඝන වස්තුවේ නම කුමක්ද? එවැනි හැඩ පරිසරයේ දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න.

03) “ $>$ ”, “ $<$ ” හෝ “ $=$ ” සංකේත යොදා හිස්තැන සම්පූර්ණ කරන්න.

i. $\frac{5}{6}$ ........ $\frac{4}{6}$ ii. $\frac{5}{7}$ ....... $\frac{10}{14}$

iii. (a) පහත සඳහන් භාග ආරෝහණ පිළිවෙළට ලියන්න. $\frac{4}{5}, \frac{4}{10}, \frac{4}{7}, \frac{4}{8}$

(b) සුළු කරන්න.

1) $\frac{3}{7} + \frac{2}{7}$ 2) $\frac{2}{3} + \frac{1}{12}$ 3) $\frac{4}{5} - \frac{7}{20}$

04)

i. පහත සඳහන් සංඛ්‍යාවල සාධක හතර බැගින් ලියන්න.
a) 24 b) 60
ii. 20 ට වඩා විශාල 4 හි ගුණාකාර හතරක් ලියන්න.
iii. පහත සඳහන් සංඛ්‍යා අතරින් ඉතිරි නැතිව 5න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.
235, 346, 558, 390
iv. පන්තියක සිසුන් 50 දෙනෙකු සිටිති. එක් කණ්ඩායමකට සිසුන් දෙදෙනෙකුට වඩා සිටිනසේ ද සෑම කණ්ඩායමකම සමාන සිසුන් ගණනක් සිටින සේ ද සිසුන් 50 දෙනාවම කණ්ඩායම් කළවිට එක් කණ්ඩායමක සිටිය හැකි සිසුන් සංඛ්‍යා සියල්ල ලියන්න.

05)

i. දී ඇති වගුව පිටපත් කරගෙන එක් එක් අවස්ථාවල දිග මැනීම සඳහා සුදුසු උපකරණය හා ඒකකය හිස්තැන්වල ලියන්න.

| **අවස්ථාව** | **සුදුසු උපකරණය** | **ඒකකය** |
|---|---|---|
| බිත්තියක උස | මීටර් කෝදුව | මීටර් |
| අභ්‍යාස පොතේ ඝනකම | ............... .............. | ................ .............. |
| ගසක වට ප්‍රමාණය | ............... .............. | ...... ........................ |

ii. පහත රූපවල පරිමිතිය සොයන්න.

(a)




(b)




iii. සෘජුකෝණාස්‍රාකාර පින්තූරයක පළල 20cm පරිමිතිය 100cm නම් එහි දිග සොයන්න.

06)



(a) රූපයේ අඳුරු කර ඇති කොටස

i. භාගයක් ලෙස ලියන්න.

ii. දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

iii. ඉහත (ii) හි සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

(b) පහත වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ඉලක්කම් | ඉලක්කම පිහිටි ස්ථානය | ඉන් නිරූපණය වන අගය |
|---|---|---|---|
| 14.63 | 6 | පළමු දශම ස්ථානය | 0.6 |
| 235.48 | 3 | දසස්ථානය | .................... |
| 316.52 | 2 | .......................... | 0.02 |
| 75.07 | 0 | ............ .............. | ....... ............ |

(c) සුළු කරන්න.

(i)

```
   2 3.8 5
+  1 1.0 4
  ________

  ========
```

(ii)

```
   1 8 .7
-  0 6 .9
  _______

  =======
```

07)

(a) කොටුව තුළ නම් කර ඇති ඒවා සුදුසු පරිදි කාණ්ඩ දෙකකට වෙන් කර එම එක් එක් කාණ්ඩ සඳහා සුදුසු නම් ලියන්න.

*ත්‍රිකෝණය* *චතුස්තලය*
*ඝනකාභය* *සෘජුකෝණාස්‍රය* *සමචතුරස්‍රය*
*සිලින්ඩරය* *රොම්බසය* *ඝනකය*

(b)

i. නිවැරදි සංඛ්‍යා රේඛාවක ලක්ෂණ දෙකක් ලියන්න.

ii. පහත සංඛ්‍යා රේඛාවේ




a) P, Q, R මගින් නිරූපිත සංඛ්‍යා ලියන්න.

b) මෙහි සඳහන් 3ට අඩු නිඛිල සියල්ල ලියා දක්වන්න.

c) 4, -1, 1, 0 සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියන්න.

PARCEL NO

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






## කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සුතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**